## 1.32 සිංහල භාෂාව උගන්වන ගුරුවරුන්ට ඇතිවන ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

අනුරිත් ඉන්දිකා දිවාකර
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. කැලණිය.

## ABSTRACT

සිංහල භාෂාව කෙරෙහි අවධානය යොමු කිරීමේ දී වර්තමානයේ දී භාෂාව භාවිතය පිළිබඳ ව පැන නැගී ඇත්තේ ගැටලු සහගත බවකි. ලංකාවේ පාසල් අධ්‍යාපනයේ දී අ. පො. ස. දක්වා ශිෂ්‍ය - ශිෂ්‍යාවන් අනිවාර්යයෙන් ම සිංහල භාෂාව ඉගෙනගනු ලැබුව ද, ඒ කාලයේ දී භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක්, අවබෝධයක් ඔවුන්ට නොලැබීම ඊට හේතුවන එක් කරුණකි. මේ සඳහා සිංහල භාෂාව උගන්වන ගුරුවරුන් සම්බන්ධ ගැටලු ප්‍රබල සාධකයක් වේ.

සිංහල භාෂාව උගන්වන ගුරුවරුන් සම්බන්ධ ගැටලු ප්‍රධාන අංශ දෙකකින් දැක්විය හැකිය. ගුරුවරුන් නිසා ඇතිවන ගැටලු හා ගුරුවරුන්ට ඇතිවන ගැටලු යි. මෙහි දී අවධානය යොමු වන්නේ ගුරුවරුන්ට ඇති වන ගැටලු පිළිබඳ ව යි. ශිෂ්‍ය තදබදය, කාලය අඩුකම, විෂය නිර්දේශ පුළුල් වීම, ප්‍රායෝගික ව භාෂාව ශිෂ්‍යයන් ලවා භාවිත කළ නොහැකි වීම, ශිෂ්‍ය ආකල්ප හා ඔවුන්ගේ රුචිකත්වය අඩුකම, ඇගයීම් ක්‍රමයේ දුර්වලතා හා බාහිර බලපෑම් ඒ කෙරෙහි ඍජුව ම බලපායි.

මේ තත්ත්වය නිසා අනාගතයේ දී සමාජයට එක්වන සාමාජිකයන් මුහුණ දෙන දුෂ්කරතා අංශ දෙකකින් දැක්විය හැකිය. ඒ භාෂාව විධිමත් ව භාවිතය පිළිබඳ ව හා සමාජමය පුද්ගලයකු වශයෙන් කටයුතු කිරීම පිළිබඳ ව යි.

ඉහත කී කරුණු මත සිංහල භාෂාව උගන්වන ගුරුවරුන්ට ඇතිවන ගැටලු හා ඒවා භාෂාවේ මෙන් ම සමාජ පරිහානියට හේතු වී ඇති ආකාරය පිළිබඳ ව අධ්‍යයනය මෙහි දී සිදු වේ.